8 ශ්‍රේණිය

# සිංහල භාෂාව හා සාහිත්‍යය

## පිරුළක මහිම

අන්තර්ගතය සහ සැකසුම - කේ. ඒ. ඉන්දික නිරෝෂන්,
ව/පු/කිවුලකැලේ මහා විද්‍යාලය පුත්තලම

Copyright © e-thaksalawa.moe.gov.lk

# පිරුළක් යනු කුමක් ද? 1

ප්‍රස්ථා පිරුළු යනු විවිධ අවස්ථාවන්ට අනුව යොදන යෙදුම් විශේෂයකි. වචන රාශියකින් ප්‍රකාශ කළ යුතු අදහසක් ඉතා කෙටියෙන්, අර්ථාන්විතව හා රසවත් ව දැක්වීමට පිරුළු භාවිත කරනු ලැබේ. සෑම පිරුළකට ම කිසියම් අවස්ථාවකට හෝ සිදුවීමකට පසුබිම් වූ කතාන්තරයක් තිබේ. එම කතාන්දරය දැන සිටීම පිරුළුවලින් දැක්විමට බලාපොරොත්තු වන අර්ථය වටහා ගැනීමට පහසුවකි.

Copyright © e-thaksalawa.moe.gov.lk

# පිරුළක් යනු කුමක් ද? 2

පුරාතන ගද්‍ය සාහිත්‍යය (නිද - සද්ධර්මරත්නාවලිය/ පාතක පොත ), අතීතයේ සිදුවී ඇති සිදුවීම්, ගමරාළ,අන්දරේ, මහදැනමුත්තා වැනි පුද්ගලයින්ගේ ක්‍රියාකාරකම් හා විවිධ සත්ත්ව චර්යාවන් පිරුළු නිර්මාණය වීමට ප්‍රධාන වශයෙන් හේතු වී ඇති අයුරු හඳුනා ගත හැකි ය. ඇතැම් විට සන්සන්දනාත්මක ව අදහස් දක්වන පිරුළු ද හඳුනා ගත හැකි ය.

( නිද - රයිගමයයි ගම්පලයයි, දුප්පත්කම හා වලිගය නැති ගොනා )


Copyright © e-thaksalawa.moe.gov.lk

# පිරුළක මහිම



වැඩි දුරටත් තොරතුරු දැනගැනීම සඳහා
7 ශ්‍රේණිය පෙළපොතෙහි එන
“ පිරුළක මහිම ”
පාඩම කියවන්න.

Copyright © e-thaksalawa.moe.gov.lk

පාඩමෙහි එන පිරුළු කිහිපය හඳුනාගනිමු.

1

පරංගියා කෝට්ටේ ගියා වාගෙයි.
කටුස්සාගේ කරේ රත්තරන් බැන්දා වාගෙයි.
අන්දරේ සීනි කෑවා වාගෙයි.
අන්දරේ පොල් පැළ සිටෙව්වා වාගෙයි.
මහදැන මුත්තා වී වැපුරුවා වාගෙයි.
ගමරාල දිව්‍ය ලෝකයේ ගියා වාගෙයි.
නරියා රජවුණා වාගෙයි.
කූඤ්ඤය ගැළ වූ වඳුරා වාගෙයි.

Copyright © e-thaksalawa.moe.gov.lk

පාඩමෙහි එන පිරුළු කිහිපය හඳුනාගනිමු.

2

ඉබ්බාට පැරදුණු හාවා වාගෙයි.
බතල කන්න පොල් තේරුවා වාගෙයි.
රයිගමයයි ගම්පලයයි වෙළදාමේ ගියා වාගෙයි.
ආඬි හත් දෙනාගේ කැඳ හැලිය වාගෙයි.
ඉත්තෑවාගේ ගුලට කබැල්ලෑවා රිංගුවා වාගෙයි.
බළලුන් ලවා කොස් ඇට බාවන්නා වාගෙයි.
කැකිල්ලේ රජ්ජුරුවන්ගේ නඩු තීන්දුව වාගෙයි.
තණකොළ කපන්න කිතුල් ගහට ගියා වාගෙයි.

e තක්සලාව
Copyright © e-thaksalawa.moe.gov.lk

පාඩමෙහි එන පිරුළු කිහිපය හඳුනාගනිමු.

3

සිංහ හම පොරවා ගත් කොටළුවා වාගෙයි.
ආචාරියා රවටා කැත්ත හදවා ගත්තා වාගෙයි.
කපුටු පිහාටුව කපුටන් හත් දෙනෙකු වුණා වාගෙයි.
කළු හාමිගෙ අප්පච්චි අස්සයා දැවැද්දට දුන්නා වාගෙයි.
බල්ලාගේ වැඩය බූරුවා බාර ගත්තා වාගෙයි.
නරියාට කුකුළන් බාර දුන්නා වාගෙයි.
ගම හාමිනේ කොණ්ඩය කප්පවා ගත්තා වාගෙයි.

Copyright © e-thaksalawa.moe.gov.lk

# වෙනත් පිරුළු කිහිපයක් හඳුනාගනිමු.

1

1 අටුව කඩා පුටුව හැදුවා වගේ.
2 අටුවෙන් දුමට පැන්නා වගේ.
3 අඬුව තියෙද්දි අත පුච්ච ගත්තා වගේ.
4 අත හයිය නම් බත නොවැරැදේ.
5 කබලෙන් ලිපට වැටුණා වගේ.
6 අතරමඟදී අත්වැල කැඩුණා වගේ.
7 අතදීලා දත නියවනවා වගේ.
8 කොරේ පිටට මරේ.
9 ලිදේ ඉන්න ගෙම්බා වගේ.
10 වක්කඩේ හකුරු හැංගුවා වගේ.

Copyright © e-thaksalawa.moe.gov.lk

# වෙනත් පිරුළු කිහිපයක් හඳුනාගනිමු.

2

11 අතු කඩා මොර කන්නා වගේ.

12 අතිරසත් තිත්ත වෙනවාලු.

13 අනුන්ගේ මඟුල්ගෙදර දී තමන්ගේ සැළකිලි පෙන්වන්නා වගේ.

14 අන්තිම ඉත්තත් අදිනවා.

15 අනුන්ගේ පානෙන් එළිය බලනවා වගේ.

16 අනුන්ට හෑරූ වළේ තමන්ම වැටුණා වගේ.

17 අනේ කාලේ වනේ වාසේ.

18 අන්ධයා ඇතාගේ හැටි කිව්වා වගේ.

Copyright © e-thaksalawa.moe.gov.lk

# වෙනත් පිරුළු කිහිපයක් හඳුනාගනිමු. 3

19 අබ කෑ මිනිහාගේ නහය දනවා වගේ.
20 අබරන් සිල් ගත්තා වගේ.
21 අබුද්දස්ස කාලේ ලබුත් තිත්තලු රාලේ.
22 නොකෙරෙන වෙදකමට කෝදුරු තෙල් හත් පට්ටයක් ඕනැලු.
23 අමු කැවිලා වගේ.
24 අම්මා පෙවූ රන් කිරි මතක් වීම.
25 අරුම පුදුම රටේ පනමට පොල් හැටේ.

Copyright © e-thaksalawa.moe.gov.lk

# වෙනත් පිරුළු කිහිපයක් හඳුනාගනිමු.

4

26 අලි යන සිදුරු තිබිය දී කූඹි යන තව වැහීම.

27 අලි ගිය අඩිපාර බලන්න කණ්ණාඩිත් ඕනෑ ද?

28 අශ්වයාට අං ලැබුණා වගේ.

29 අහසට ඉණිමං බඳින්නා වගේ.

30 අහසේ මාලිගා තනනවා වගේ.

31 අළු ගොඩට පිම්බා වගේ.

32 අහසේ තරු වගේ.

33 ඉබ්බාගෙන් පිහාටු ඉල්ලනව වගේ.

34 ගලෙන් පට්ටයක් ගන්නව වගේ.

35 ගහට ඉණි කපනවා වගේ.

Copyright © e-thaksalawa.moe.gov.lk

# වෙනත් පිරුළු කිහිපයක් හඳුනාගනිමු.

5

36 ආච්චි මළ දවස වගේ.

37 ආටානාටිය කියන්නා වගේ.

38 ආතාට අටුකොස් දුන්න වගේ

39 ආරේ ගුණ නෑරේ.

40 ඇතා ගිලපු දිවුල වාගෙයි.

**41 වත්ත බද්දට දී ඇස්සට දත් නියවන්නා වගේ.**

Copyright © e-thaksalawa.moe.gov.lk

# වෙනත් පිරුළු කිහිපයක් හඳුනාගනිමු.

6

42 ඇතා වැහැරුණත් කොරහේ නාවන්න බැහැ.
43 ඇද ගසේ සෙවණැල්ලත් ඇදලු.
44 ඇඳිරි ගෙට කැවුම් දික්කළා වගේ.
45 මාළුවාට ඇම දාන්නා වගේ.
46 ඇල්වතුරෙන් බෙල්ල කපනවා වගේ.
47 එපා වාහෙට හොඳි බෙදන්නා වගේ.
48 කක්කුට්ටා කෙළින් යන්න ඉගැන්නුවා වගේ.
49 දිය රෙද්දෙන් බෙල්ල කැපුව වගේ.
50 අගේ ඉදන් කන කනවා වගේ.

Copyright © e-thaksalawa.moe.gov.lk

# වෙනත් පිරුළු කිහිපයක් හඳුනාගනිමු.

7

51 ඇවිළෙන ගින්නට පිදුරු දමන්නා වාගේ.
52 ඉඟුරු දී මිරිස් ගත්තා වගේ.
53 ඉණිමගට පයින් ගහන්නා වගේ.
55 ඉබි කබලුත් බේතට ඕනෑලු
56 ගඟෙන් දිය බී මුහුදට ආවඩන්නා වගේ.
57 නටන්න බැරි මිනිහට පොළොව ඇදයි ලු.
58 බල්ලො බිරුවට කඳු පාත්වෙන් නෑ.
59 වඳුරට දැලි පිහිය අහුවුණා වගේ.

Copyright © e-thaksalawa.moe.gov.lk

# වෙනත් පිරුළු කිහිපයක් හඳුනාගනිමු.

8

60 අතීසාරෙට අඹුඩ ගහනව වගේ.
61 උගුරට හොරා බෙහෙත් කන්නා වගේ.
62 ඉසරුදාවට කොට්ටෙ මාරු කළා වගේ.
63 උඳු වපුරා මුං බලාපොරොත්තු වෙන්නා වගේ.
64 උරුලෑවා ගිය පාර වාගේ.
65 එළිපත්තේ ඉන්නා බළලා වගේ.

Copyright © e-thaksalawa.moe.gov.lk

# ස්තුතියි.

තමන් හිසට තම අතමය සෙවනැල්ල.

Copyright © e-thaksalawa.moe.gov.lk